# කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
# දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

## කලා ඩිප්ලෝමාව හා කලා උසස් ඩිප්ලෝමාව
## (Fallback Qualification)

## සවිස්තරාත්මක අධ්‍යයන වාර්තා ලබාගැනීම

2007, 2008 හා 2009 යන අධ්‍යයන වර්ෂවල ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධිය සඳහා ලියාපදිංචි වී උපාධිය සම්පූර්ණ කිරීම සඳහා ලබා දී තිබූ උපරිම කාලසීමාව තුළ උපාධිය සම්පූර්ණ කර ගැනීමට නොහැකි වූවන් සඳහා ඔවුන් විසින් ලබා ඇති ප්‍රතිඵලවලට අනුව කලා ඩිප්ලෝමාව හෝ කලා උසස් ඩිප්ලෝමාව ප්‍රදානය කිරීමට විශ්වවිද්‍යාලය විසින් තීරණය කර ඇති අතර ඒ සඳහා සුදුසුකම් ලබා ඇති විද්‍යාර්ථීන්ගේ නාමලේඛන අප වෙබ් අඩවියෙහි පළ කර ඇත.

මීට අදාළ සවිස්තරාත්මක අධ්‍යයන වාර්තාව (Academic Record) **2026 ජූලි මස 27 දින සිට අගෝස්තු මස 31 දින දක්වා සතියේ දිනයන්හි දී** ලබාගත හැක.

ඒ සඳහා දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ වෙබ් අඩවියට **(www.cdce.kln.ac.lk)** පිවිස බාගත කරගත් අයදුම්පත නිසි ලෙස සම්පූර්ණ කර රු.1000/- ක මුදල ගෙවීමෙන් අනතුරුව පහත දැක්වෙන **එක් ක්‍රමයක්** මගින් ලබාගැනීමට හැකියාව පවතී.

01. දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය වෙත අයදුම්පත හා මුදල් ගෙවන ලද වවුචර්පත මධ්‍යහ්න 12.00 ට පෙර ගෙනැවිත් බාරදීමෙන් එදිනම ප.ව. 2.00 ට ලබාගත හැක.

02. අයදුම්පත හා මුදල් ගෙවන ලද වවුචර්පත "**නියෝජ්‍ය ලේඛකාධිකාරී, දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය, අංක. 56/6, කෝන්ගහවත්ත පාර, නුවර පාර, කිරිබත්ගොඩ.**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමුකිරීමෙන් පසු තම පෞද්ගලික ලිපිනයට ගෙන්වා ගත හැක.

| |
|---|
| මේ සඳහා මීට පෙර රු.1000/-ක මුදලක් ගෙවා අයදුම් කර ඇත්නම් නැවත සවිස්තරාත්මක අධ්‍යයන වාර්තාව අයදුම් කිරීම අවශ්‍ය නොවන අතර අදාළ අධ්‍යයන වාර්තාව ඉදිරියේදී තම පෞද්ගලික ලිපිනය වෙත තැපැල් මගින් යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. |

එසේම ඉහත ඩිප්ලෝමාව හා උසස් ඩිප්ලෝමාවට අදාළ ඩිප්ලෝමාලාභීන් සඳහා නියමිත ඩිප්ලෝමා ප්‍රදානෝත්සව අයදුම්පත 2026.07.27 දින සිට අප වෙබ් අඩවියෙන් **(www.cdce.kln.ac.lk)** බාගත කර ගැනීමේ හැකියාව පවතින අතර එසේ බාගත කරගත් අයදුම්පත **2026.08.31** දිනට පෙර නිසි ලෙස සම්පූර්ණ කර රු. 5000/- ක මුදල ගෙවීමෙන් අනතුරුව ඉහත දක්වා ඇති ලිපිනයට තැපැල් කළ යුතුය.

නියෝජ්‍ය ලේඛකාධිකාරී,
දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය,
කැලණිය විශ්වවිද්‍යාලය,
කැලණිය.
2026.07.21